


# දිනෙන් දින



ශ්‍රී ලාංකේය හෙළ ගී කෙතේ අපේ ම හැඩ රුව සනිටුහන් කරලීමෙහි ලා මුල් අවධියේදී ම මහඟු මෙහෙවරක් ඉටු කළේ අපේ ම සුභාවිත ගීයයි. සූර්ය ශංකර් මොල්ලිගොඩ, ආනන්ද සමරකෝන් වැනි සංගීතවේදීන්ගෙන් අනතුරුව හෙළ ගීයේ හැඩ රුව සකස් කරගන්නට වෙහෙස වූවන් අතරේ සුනිල් සාන්තයන් මෙන් ම පණ්ඩිත් අමරදේවයන් මුල් තැන ගනිති. ඒ නැමියාවන් සමඟින් වඩාත් රසිකයිනට සුභාවිත ගීය සමීප කරවීමෙහි ලා උනන්දු වුණ ඊ ළඟ පරපුරෙහි මූලිකයන් ලෙස ආචාර්ය වික්ටර් රත්නායක සහ මහාචාර්ය නිපුන් සනත් නන්දසිරි සංගීතවේදී සුධීමතුන් හැඳින්විය හැකියි.

ආචාර්ය වික්ටර් රත්නායකයන් වඩ වඩාත් ප්‍රායෝගිකව නිර්මාණාත්මක ගීතය කෙරෙහි යොමු වෙද්දී සනත් නන්දසිරි මහාචාර්යවරයාණන් වඩාත් උත්සුක වූයේ න්‍යායාත්මක ව මියැසිය හදාරමින් ඊට සමගාමීව නිර්මාණ කිරීමටය.

මහාචාර්ය සනත් නන්දසිරි සංගීතවේදියාණන් විසින් ම තනුවත්, සංගීතයත් නිර්මාණය කරගෙන ගායනා කළ ඉතාම ළයාන්විත මධුර ගීතයකි, අද අපගේ අවධානයට යොමු වෙන්නේ. තමන්ගේ ම තනුව සිය ගැඹුරු හඬින් භාවයන් මුසු කරමින් ගයන්නට මහාචාර්යවරයා බෙහෙවින් ම උනන්දු වී ඇත්තේ එහි පද රචනාව නිසාවෙන් යැයි සිතේ. සුනම්‍ය පද අමුණා සුරම්‍ය පද පෙළක නිබන්ධකයාණන් කැටි කරවන්නේ ආදරණීය හර බර අරුතක්. විරහ වේදනාව තුළින් විප්‍රලම්භ ශෘංගාරය ඉස්මතු කරන්නා ගමන් ම අවසන සම්ප්‍රයෝග ශෘංගාරයක්ද උපද්දවා ගන්නට මේ ප්‍රවීණයා සමත් වෙන්නේ නිරායාසයෙන්. ලියූ ගී පද රචනා සියල්ල ප්‍රශස්ත මට්ටමේ රඳවා ගන්නට සමත් වූ බණ්ඩාර කේ. විජේතුංගයන් ය, මේ ප්‍රවීන ගී පද නිබන්ධකයා.

යමෙක් හෝ යමක් අප වෙත ඇති තාත් කල් අගයක් නොමැතියි අපට ඒ පිළිබඳව. එහෙත් ඒ පුද්ගලයා හෝ ඒ දේ අපෙන් දුරස් වන්නට වන්නට ඒ පිළිබඳව අපගේ ආශක්ත වීම වැඩි වීමයි ස්වභාවය. පද පෙළින් කියැවෙන්නේ දුරස් වෙමින් සිටින ආදරවන්තියක සහ ආදරයක් පිළිබඳව. ඇයත් ඇයගේ ආදරයත් දුරස් වන විට සිතින් ඔහු ඇයට තවත් ළං වෙයි.

සයුරක රැදුරු රළ පෙළ හඬක් නැගුවද ඔහුට ඒ හඬ ඇසෙන්නේ නැති. බිහිරි වී ඇති සේ ය, ඔහුගේ දෙසවන. රැ යෙහි අහස පුරා පොකුරු විලස විසිර ඇති තරු කිණිති නො පෙනනෙන්නේය ඔහු හට. අන්ධ වී ඇති සේ ය ඔහුගේ දෙසවන. මුළු ලොවම අමතක ව ගිය සේ ය ඔහුට. දුරස් වී යන ඇයගෙ න් විස්තෝප වන සිතේ සංකාව අන්ධයෙකකු, බිහිරෙකු බවට පත් කර ඇති සේය මේ පෙම්වතාව.

මළානිකව වියැලී ගිය විලක් සේ ය, ඔහුගේ හදවත. ඒ හදවත් ඉවුරේ ඇගේ පිය සටහන් තව ම රැඳී ඇත්තේ ය. හද පත්ලෙන් ම ආදරය කළ ඔහුට ඇය සමඟ ගත කළ අතීතයේ මතක සටහන් රැඳී ඇත්තේ ඒ ආ ආදරණීය ගමනේ පිය සටහන් ලෙසින්. පර වී යන කුසුමක ශෝකාකූල මල් පෙති තවමත් නො සැලී පවතින්නේ ඇයගේ ඇසින් නො හැලෙන කඳුළු බිඳු සේ ය. ඇයට අතීත ආදරය පිළිබඳව දුකක් නැති. ඒ නිසා ම ඇයට කඳුළු සැලීමක් ද නැති.

මේ සියළු අතීතාවර්ජන අතරෙන් පෙම්වත් ඔහු දකිනා සුබ සිහිනයක් අවසන ඉස්මතු වෙයි. අතීතයේ පරිද්දෙන් ම ඇයගේ හසරැළිවලින් පිරුණ සිහිනයකි ඒ. ඒ සිහිනයෙන් ඔහුට නැවත පිබිදිය හැකියි. සතුටින් පිරුණ සයුරකින් නැගෙනා ශ්‍රියා කාන්තාව ලෙසින් නැවත ඔහු වෙත සපැමිණෙන්නටය ඇයට ඔහුගේ ආරාධනාව.

මෙවන් හරවත් අරුතකින් යුත් බණ්ඩාර කේ විජේතුංගයන්ගේ පද පෙළ තනු ගැන්වීමේදී සනත් නන්දසිරි සංගීතවේදීයාණන් යොදාගන්නේ හැඟීම් බර තනුවක් ගැයිමට උචිත රිද්ම රටාවක්. මාත්‍රා තුනයි, දෙකයි, දෙකයි රටාවට බිඳෙන රිද්මය ගී ය පුරාවට ම පුරන්නේ තබ්ලාවයි. මද ලයෙන් නැතහොත් මද වේගයෙන් ගායනය වන තනුව හැඟීම් බර වෙන්නේ විටින් විට උච්ච ස්වර වල රැඳෙනා ස්වර සංගති නිසාවෙන්. ස්ථායි කොටසේ 'තවත් ළංවනු.........' 'අන්තරා කොටස් වල 'බිහිරි වී ඇත....., 'අන්ධ වී ඇත....', 'ඔබගේ පියවර...', 'ඔබෙන් නො සැලෙන....' වැනි පද උස් ස්වරවලින් ගැයීම ඇරඹීමත්, අනෙකුත් කොටස් පහත් ස්වරවල රැඳවීමත් සංගීතවේදියාණන් කරන්නේ රසික හද පත්ලටම තනුවත්, ගායනයත් කිඳා බස්සවමින්. හද පත්ලේ සදා රැඳෙනා ගීයක් බවට මේ ගීය පත් කරවන්න ට සනත් නන්දසිරි සංගීතවේදියාණන්ගේ නිර්මාණ දායකත්වය මෙන්ම ශිල්පීය දායකත්වය ද උපරිමයන් ලැබී ඇති බව වෙසෙසින් ම කිව යුතුයි.

වයලින් පෙළකින් පසු සිතාර් ගත් පෙළකින් මුල පුරනා පෙර වැයුම ශෝක රසය ම නංවන්නට නිර්මාණය වූවක්. පද ගැයෙන අතරේ වයලීනයෙන් මෙන් ම සිතාරයෙන් වැයෙන වාද්‍ය ඛණ්ඩ අරුත ඉහළට නංවන්නේ ශ්‍රාවකයා වඩාත් සංවේදී කරමවමින්. අන්තර් වාදනය ඇරඹීමේදී සැක්සෆෝනය ද යොදා ගනිමින් සිත කීරි ගන්වන්නට සංගීතවේදියාණන් උනන්දු වී ඇති සේය. ඒ ද ඒ වයලින් සහ සිතාර් වාදන අතික්‍රමණය කරවමින් නම් නොවේ.

අද වන විට මේ පද පෙළ නිබන්ධනය කළ බණ්ඩාර කේ. විජේතුංගයන් ජීවතුන් අතර නැත. විජේතුංගයන්ට නිවන් සුව පතන්නට මෙය අවස්ථාව කර ගන්නා අතර ම මහාචාර්ය සනත් නන්දසිරි සංගීතවේදී ගායන ශිල්පියාණන්ට දිගාසිරි පතමු.

දිනෙන් දින ඔබ මා වෙතින්
දුරස් වන විට මගේ මනසට
තවත් ළං වෙනු පවණෙකිය - ඔබ
දිනනේ දින ඔබ මා වෙතින්.....

රැදුරු රළ පෙළ හඬක් නො නැගෙයි
බිහිරි වී ඇත මගේ දෙසවන
රැයෙහි තරු මල් කිනිති නො පෙනෙයි
අන්ධ වී ඇත මගේ දෙනයන
දිනෙන් දින ඔබ මා වෙතින්.....

මළානික හද විලේ ඉවුරේ
ඔබේ පියවර ළකුණු අහුරකි
මිළින කුසුමෙක කඳුළු මල් පෙති
ඔබෙන් නො හැලෙන කඳුළු බිඳු වැනි
දිනෙන් දින ඔබ මා වෙතින්.......

ඔබේ හසරැළි සිහින අතරේ
යළිත් මා මන පුබුදුවන්නට
සතුටු සයුරේ නැගෙන සිරිකත
විලස මා වෙත නැවත එනු මැන

දිනෙන් දින.......

*රචනය:*
බණ්ඩාර කේ. විජේතුංග

*තනුව සංගීතය සහ ගායනය:*
මහාචාර්ය, නිපුන් සනත් නන්දසිරි



සිසිර දිසානායක